වාර්ෂික වාර්තාව 2011

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය,
2වන මහල , බටහිර කුළුණ, සෙලින්කෝ මන්දිරය,
අංක 69, ජනාධිපති මාවත, කොළඹ 01
2013/02/06

ගරු කර්මාන්ත සහ වානිජ **කටයුතු** අමාත්‍යතුමා,
කර්මාන්ත සහ වානිජ **කටයුතු** අමාත්‍යාංශය,
තැ.පෙ. 570, 73/1, ගාලු පාර,
කොළඹ 03

ගරු අමාත්‍යතුමනි,

වාර්ෂික වාර්තාව **2011**

1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2) උප වගන්තිය අනුව මම පහත ලේඛන ඉදිරිපත් කරමි.

01. 2011 වර්ෂය සඳහා ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තාව.

02. 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා ආදායම් සහ වියදම් ප්‍රකාශය සහ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය.

03. විගණකාධිපති වාර්තාව

මෙයට, විශ්වාසි,

එන්.එම්.ෂහීද්
සභාපති/ අධ්‍යක්ෂ ජනරාල්
ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය

දැක්ම

"ජාතියේ ආර්ථික, දේශපාලනික සහ සමාජයීය අභිලාෂයන් උදෙසා දායක වන්නා වූ ක්‍රියාශීලී , චිරස්ථායි සහ තරඟකාරී ව්‍යවසාය අංශයක් ගොඩනැංවීම"

"ශ්‍රී ලංකාවේ ජාතික ආර්ථිකයෙහි අවශ්‍යම අංගයක් ලෙස ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියෙහි ව්‍යවසායයන්ගේ සංවර්ධනය, වැඩීම සහ තරඟකාරී බව සඳහා පහසුකම් සැපයීම සහ සක්‍රිය ලෙස ඒවාට උපකාර කිරීම"

මෙහෙවර

- ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය සඳහා ආයෝජනයන් කිරීම, උනන්දු කරලීම් හා පහසුකම් සැපයීම තුලින් ශ්‍රී ලංකාවේ ආර්ථිකය වර්ධනය කිරීම, පුළුල් කරලීම හා සංවර්ධනය සඳහා උනන්දු කරලීම

- ශ්‍රී ලංකා භූමියෙන් බැහැරව ව්‍යවසායන් ඇති කිරීම හා ක්‍රියාත්මක කරලීම උනන්දුවක් ඇති කිරිම හා රුකුල් දීම කරමින් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරි පනතේ සඳහන් පරමාර්ථ වන විදේශිය වෙළඳපල වෙත ප්‍රවේශ විය හැකි දේශීය ව්‍යවසායන් ජාත්‍යන්තර තලයට ගෙන ඒම.

- යථාවත් ලෙස සැකසූ ප්‍රතිපත්ති, සැළසුම්, ප්‍රවර්ධනාත්මක දිරිදීමනා සැකසීම හා කර්මාන්ත/ කෘෂිකර්මය වැඩිදියුනු කරලීම සහ වෙළදාම සඳහා පූර්ණව සහාය දැක්වීම/ ප්‍රවර්ධන පියවර ගැනීම

- ව්‍යවසාය සංවර්ධනයේ අත්‍යවශ්‍ය අංගයක් වන තාක්ෂණ කුසලතා ඇති කරමින් මානව ප්‍රාග්ධන සංවර්ධනය සහිත ජනයා වඩ වඩාත් ශක්තිමත් කරලීම.

- සංවර්ධන අවශ්‍යතාවයන් සඳහා අවශ්‍ය කරන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම

- ව්‍යවසාය සංවර්ධනය හා කරගෙන යාමට ව්‍යවසායකයන් හට මූල්‍ය පහසුකම් සඳහා වන ප්‍රවේශය පහසු කරලීම.

- නිෂ්පාදන සංවර්ධනය, තාක්ෂණය උසස් කිරීම සහ පේටන්ට් බලපත්‍ර සමබන්ධයෙන් පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සඳහා තාක්ෂණ සංවර්ධන අරමුදලක් පිහිටුවීම.

- ප්‍රාදේශීය ආර්ථික සංවර්ධනය සඳහා පහසුකම් ඇති කරලීම.

01. එම්.එස්.එස්. අමීර් අලි මහතා
සභාපති/ අධ්‍යක්ෂ ජනරාල්

02. එම්.ඒ. තාජුදීන් මහතා
අතිරේක ලේකම්- කර්මාන්ත හා වාණිජ **කටයුතු** අමාත්‍යාංශය
MOICහි ලේකම් නියෝජනය කරන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

03. ටී.එන්.ඔෂාන් මහතා
අධ්‍යක්ෂ – රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව,
මුදල් අමාත්‍යාංශය
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

04. පූජ්‍ය ඇල්පිටියේ සුගුනකීර්ති හිමි
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

05. ඒ.එල්. මොහමඩ් හලීක් මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

06. එස්. ලක්ෂ්මන් මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

07. එන්.එම්.ෂහීඩ් මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

08. එම්.ඒ.සී.එම් අමීන් මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

09. එස්. හේරත් මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

01. ව්‍යවසාය ප්‍රතිපත්තිය

ශ්‍රී ලාංකීය ව්‍යවසායක ජාලයක් කරා

1.1 ජාතික ව්‍යවසාය සභාව:

පහල මට්ටමේදී නොවිසඳුනු ගැටළු විසඳීම සඳහා ඉහළම මට්ටමේ ආයතණික නිර්මාණය වන්නේ ජාතික ව්‍යවසාය සභාවයි. මෙම සභාව විසින් ප්‍රතිපත්ති නිර්මාණය කිරීමේ අරමුණු සඳහා ගැටළු භාවිතා කරයි. මෙම සභාව පිහිටුවීමට අවශ්‍ය කටයුතු සඳහා කැබිනට් පත්‍රිකාවක් කර්මාන්ත හා වාණිජ අමාත්‍යංශය වෙත ඉදිරිපත් කරන ලදී.

1.2 ජාතික ව්‍යවසාය සංසදය

විවිධ මට්ටමේ ව්‍යාපාර ප්‍රජාවන් අතර යහපත් සම්බන්ධීකරණයක් සහ සන්නිවේදනයක් ඇති කිරීම සඳහා NEDA විසින් ආයතණික නිර්මාණයක් ප්‍රවර්ධනය කෙරේ. (කරුණාකර 1 ඇමුණුම බලන්න) විවිධ කොටස්කරුවන් නියෝජනය කරනු ලබන ඉහළ මට්ටමේ නිළධාරීන්ගෙන් ජාතික ව්‍යවසාය සංසදය (NEF) සමන්විත වේ. ජාතික මට්ටමින් හඳුනාගත් ව්‍යාපාර ගැටළු සහ නිර්මාණයේ පහළ මට්ටමේදී මෙතෙක් නොවිසඳී ඇති ගැටළු ජාතික ව්‍යාවසාය සංසදයේදී සාකච්ඡා කෙරේ. රැස්වීම් 3ක් පවත්වන ලද අතර එහිදී සාකච්ඡා කරනු ලැබූ ගැටළු පහතින් දැක්වේ :

i. ව්‍යවසායන් සඳහා විදුලි සීමාව
ii. පාසල් සිසුන්ගේ ව්‍යවසායතක්වමය හැකියාව වර්ධනය කිරීම
iii. පශු සම්පත් ප්‍රතිපත්තිය සහ ව්‍යවසායන් සඳහා එහි භාවිතාව
iv. ව්‍යවසායන් සඳහා වඩා හොඳ සේවයක් සැපයීමට රාජ්‍ය පෞද්ගලික සංවාදය
v. අනුරාධපුර සහ පොලොන්නරුව යන දිස්ත්‍රික්කයන් තුල ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ ප්‍රමාදය
vi. අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ ව්‍යාපාරයන් සඳහා ඉඩම් ලියාපදිංචි කිරීමේ අශක්‍යතාවය
vii.SME සඳහා ණය අනුපාත ක්‍රමය

1.3 දිස්ත්‍රික් ව්‍යවසාය සංසදය

NEDA උපාය මාර්ග සැලැස්ම අනුව, එහි ව්‍යවසායකයින්ට ව්‍යාපාර සංවර්ධන සේවා සැලසීම පිණිස දිස්ත්‍රික් ව්‍යාපාර සංසද (DEF) පිහිටුවීම ඇතුළත් වේ. DEF ස්ථාපිත කෙරෙනුයේ දිස්ත්‍රික්ක මට්ටමින් වන අතර ඊට රජයේ සහ රාජ්‍ය නොවන BDS (ව්‍යාපාර සංවර්ධන සේවා) සැපයුම්කරුවන්, වාණිජ මණ්ඩල හා දිස්ත්‍රික්කයේ වෙළඳ හෝ ව්‍යාපාර සංගම් අයත් වේ.

වැඩසටහනේ අරමුණු:

- දිස්ත්‍රික් මට්ටමේ ව්‍යාපාර සංවර්ධන සේවා සැපයුම්කරුවන් අතර සම්බන්ධතා ගොඩනැංවීම
- රාජ්‍ය පෞද්ගලික සංවාදයකට පහසුකම් සැලසීම
- DEF සහ SME සංගම් අතර නිසි සම්බන්ධීකරණයක් ඇති කිරීම
- DEF සංසද හරහා ව්‍යවසායකයින්හට ව්‍යාපාර සංවර්ධන සේවා සැපයීමට ක්‍රමයක් සංවර්ධනය කිරීම
- දිස්ත්‍රික් මට්ටමේ සංසදවල සිට ජාතික මට්ටමේ සංසද දක්වා ව්‍යාපාරික ගැටළු ඒකරාශී කිරීම

මූල්‍ය හා තාක්ෂණික මාර්ගෝපදේශ සමඟින් NEDA විසින් මෙම DEF සංසද ශක්තිමත් කරමින් සිටී. එසේම, NEDA කාර්ය මණ්ඩලයද මාර්ගෝපදේශ සැලසීම පිණිස සංසද රැස්වීම්වලට සහභාගී වන අතර DEF සංසදවල ප්‍රගතිය අනුව මූල්‍ය සහාය ලබා දේ.

අනුරාධපුර, ගාල්ල, යාපනය. හම්බන්තොට, මොනරාගල, පොලොන්නරුව, මන්නාරම, මහනුවර, මාතලේ, අම්පාර, මඩකලපුව, බදුල්ල සහ කුරුණෑගල දිස්ත්‍රික්කයන් තුළ NEDA හි පරමාර්ථයන් ලඟාකර ගැනීම සඳහා දිස්ත්‍රික් ව්‍යවසාය සංසද පිහිටුවනු ලැබූ අතර දිස්ත්‍රික් ව්‍යවසාය සංසද කටයුතුවලට NEDA දායක වී ඇත. ගම්පහ, රත්නපුර, කෑගල්ල, ත්‍රිකුණාමලය, මාතර සහ පුත්තලම දිස්ත්‍රික්කයන් තුළ දිස්ත්‍රික් ව්‍යවසාය සංසද පිහිටුවීම සඳහා කටයුතු ආරම්භ කරන ලදී.

NEDA විසින් කර්මාන්ත සහ වාණිජ අමාත්‍යංශයේ RISC නිළධාරීන්ගෙන් සහය ලබා ගැනීමට අපේක්ෂා කරන අතර NEDA විසින් අනාගත කාර්යයන් පිළිබඳව ඔවුන්ව දැණුවත් කිරීම සඳහා වැඩමුළු පවත්වා ඇත. එයට අමතරව, මෙම වැඩසටහන සාර්ථක කර ගැනීමට දිස්ත්‍රික් වාණිජ මණ්ඩල සාමාජිකයන් සඳහා දැණුවත් කිරීමේ සහ අත්දැකීම් බෙදා ගැනීමේ වැඩ සටහන් සකස් කර ක්‍රියාත්මක කරන ලදී. එමෙන්ම, NEDA විසින් දිස්ත්‍රික් ව්‍යවසාය සංසද (DEF) දැණුවත් කිරීම සඳහා FCCISLහි සහයෝගීතාවයෙන් වැඩමුළු දෙකක් කොළඹ සහ දඹුල්ලේදී පවත්වන ලදී.

02. තොරතුරු සඳහා ප්‍රවේශය

2.1 SME අත්පොත:



NEDA විසින් 2009 වර්ෂයේදී SME අත් පොත හඳුන්වා දෙන ලදී. ව්‍යාපාර ප්‍රජාවෙන් ලද බොහෝ අගයකිරීම මත, NEDA විසින් SME අත්පොත -2011-2012 සමාලෝචනය කර ප්‍රකාශ කිරීමට බලාපොරොත්තුවේ. අත් පොතේ මූල්‍යමය සහ මූල්‍යමය නොවන ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් සම්බන්ධ තොරතුරු ඇතුළත් වේ. අත්පොතේ ඉලක්කගත කණ්ඩායම වන්නේ විශේෂයෙන් කලාපයේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ය. මෙය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට අවශ්‍ය ආයතනයක් සේවීම සඳහා තම වටිනා කාලය නාස්ති නොකරමින් නිවසේදීම සේවාවක් ලබා ගැනීම සඳහා ඔහු යායුතු වන්නේ කොතනටද යන්න සොයා දැන ගැනීම සඳහා අගනා තොරතුරුවලින් පිරි මූලාශ්‍රයකි. එමෙන්ම බැංකු සේවාවන් සඳහාද එලෙසින්ම භාවිතා කළ හැකිය.

මෙම අත්පොතේ සංවර්ධන සහ වෙනත් විශේෂිත ණය යෝජනා ක්‍රමයන් පිළිබඳ සියළුම තොරතුරු ඇතුලත් වේ. මෙම අත් පොත මුද්‍රණය කරනු ලබන්නේ NEDA ආයතනයට වාණිජ බැංකු 6කින් අනුග්‍රහය ලබාගැනීමට හැකිවන රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාර පදනම් කර ගනිමිනි.

2.2 NEDA වෙබ් අඩවිය:

NEDA වෙබ් අඩවිය ධාරිතාවය, ගුණාත්මකභාවය සහ තොරතුරු සඳහා ප්‍රවේශවීමේ හැකියාව වර්ධනය කිරීම සඳහා ප්‍රතිව්‍යුහගත කරන ලදී පහත සඳහන් තොරතුරු දැනට ලබා ගත හැකිය;

i. අත්පොතේ ඉලෙක්ට්‍රොනික පිටපත
ii. ප්‍රතිපත්ති ලේඛන සහ ප්‍රතිපත්ති සමාලෝචන ක්‍රමය
iii. ව්‍යවසාය සංවර්ධනය පිළිබඳ විෂයය ඉගැන්වීමේ කථා සහිත වීඩියෝ

iv. වාණිජ මණ්ඩල සම්බන්ධ තොරතුරු
v. NEDA ව්‍යවසාය සංවර්ධන මැදිහත්වීම්
vi. පුවත්
vii. ව්‍යාපාර සැලසුම් ආදර්ශ

03. ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය කරා

3.1 ව්‍යවසායකත්ව සංස්කෘතිය වර්ධනය කිරීම

"ගමට ඔබින ව්‍යාපාර" වැඩසටහන:

කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසාය (SMEs) ශ්‍රී ලංකාව තුළ ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේදී තීරණාත්මක භූමිකාවක් සිදුකරන බවට හඳුනාගෙන ඇති අතර දිළිඳුකම තුරන් කිරීමට සහ විරැකියාවට විසඳුමක් වශයෙන් එය වඩා වැදගත් වේ. ශ්‍රී ලංකාව තුළ ජනගහනයෙන් බහුතරයක් ජීවත් වන්නේ සම්පූර්ණ ජනගහනයෙන් 78%ක ප්‍රතිශතයක් වේයයි තක්සේරු කර ඇති ග්‍රාමීය ප්‍රදේශතුළය. සේවා නියුක්ති සහ කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශ සංවර්ධනයේ ප්‍රධාන මූලය වන්නේ කලාපීය ප්‍රදේශවල කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ය.

වෙනත් රටවල් සමග සසඳන විට මෙම අංශය අපේක්ෂිත මට්ටමේ දායකත්වයක් ලගාකර ගෙන නොමැති බව පැහැදිළිය.

විශේෂයෙන් රටෙහි ප්‍රාදේශීය ප්‍රදේශයන්හි සංවර්ධනය සඳහා කුඩා සහ මධ්‍ය පරිමාණ අංශය NEDA විසින් සැලසුම්කර ඇති අතර ග්‍රාමීය මට්ටමේ ව්‍යාපාර ප්‍රවර්දනය කිරීම සඳහා " ගමට ඔබින ව්‍යාපාර" ලෙසින් එය නම් කර ඇත. මහින්ද චින්තනය අනුව, රටෙහි කුඩා සහ මධ්‍ය පරිමාණ අංශය ප්‍රවර්ධනය කිරීම සඳහා විශේෂ අවධානයක් යොමු කර ඇත. මෙය ව්‍යවසායකයන්ට ව්‍යාපාර හඳුනාගැනීමේ සහ තෝරාගැනීමේ පිළියම් මාර්ගයක් සඳහා තර්කානුකූල පදනමක් සපයයි.

මෙම වැඩසටහනට අයත්වන ප්‍රධාන අංගයන් තුන වන්නේ:

1. දෙන ලද භූගෝලීය ප්‍රදේශයක (දිස්ත්‍රික් මට්ටම) තරගකාරී ව්‍යාපාර අවස්ථාවන්, තරගකාරී ව්‍යාපාර අංශයන්හි සංවර්ධනය සඳහා පවතින ගැටළු සහ යෝජනාවන් හඳුනා ගැනීම.
2. නිවැරදි ව්‍යාපාරයන් සමග ව්‍යාවසායකයන් ගැලපීම.
3. වැඩසටහනේ පළමු පියවරින් යෝජිත අංශය සංවර්ධනය කිරීමේ යෝජනාවන් ක්‍රියාත්මක කිරීම.

වැඩ සටහනේ ඉහත අංගයන් තුන තුළින්, NEDA ප්‍රාදේශිය මට්ටමින් SME අංශය ප්‍රවර්ධනය කරන අතර "ගමට ඔබින ව්‍යාපාර" වැඩ සටහන තුළින් ප්‍රාදේශීය ව්‍යාපාර ආකෘතීන් සංවර්ධනය කිරීම මගින් සමස්ථ ප්‍රජාව ධෛර්යමත් කිරිම සිදු කරයි.

පළමු පියවර වශයෙන්, ''ගමට ඔබින ව්‍යාපාර'' වැඩසටහනේ පළමු අංගය කුරුණෑගල, මහනුවර, මන්නාරම සහ මඩකලපුව යන දිස්ත්‍රික්කයන්හි සම්පූර්ණ කර ඇත. NEDA මෙම වැඩසටහනේ දෙවන අංගය ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සහයෝගයෙන් ඉහත දිස්ත්‍රික්කයන්හි තෝරාගත් ප්‍රා.ලේ. කොට්ඨාශයන්වල ආරම්භ කර ඇත. දිස්ත්‍රික්ක තුනෙන් තෝරා ගනු ලැබූ ප්‍රා.ලේ. කොට්ඨාශ 3 පහතින් දැක්වේ.

<u>දිස්ත්‍රික්ක</u>	<u>ප්‍රා.ලේ.කොට්ඨාශය</u>
කුරුණෑගල	පන්නල,මහව, කුරුණෑගල, පොල්ගහවෙල, නාරම්මල
මඩකලපුව	කෝරලෙයිපත්තු බටහිර කෝරලෙයිපත්තු මධ්‍යම කලවංචිකුඩි කෝරලෙයිපත්තු දකුණ කෝරලෙයිපත්තු
මන්නාරම	මුසාලි, මන්තායි බටහිර මඩු

ප්‍රතිලාභීන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි අනුග්‍රාහයෙන් තෝරා ගනී. එක් ප්‍රා.ලේ. කොට්ඨාශයකින් ව්‍යවසායකයින් දස දෙනෙක් තෝරා ගැනීමට NEDA අදහස් කරන අතර ඔවුන් මූල්‍ය, තාක්ෂණික සහ වෙළඳපල ප්‍රවේශයන් සඳහා මෙහෙයවමින් සාර්ථක ස්වාධීන ව්‍යාපාරයක් කරා සංවර්ධනය කෙරේ. NEDA විසින් පන්නල ප්‍රා.ලේ. කාර්යාලයේ සහයෝගයෙන් ව්‍යවසායකයන් දස දෙනෙක් තෝරා ගෙන ඇති අතර තනි පුද්ගල ව්‍යාපාර සැලසුම් සම්පූර්ණ කර ඔවුන්ගේ ව්‍යාපාර කටයුතු සඳහා ප්‍රදානයන් සපයා ඇත.

3.2 ශ්‍රී ලාංකේය ව්‍යවසායකයන්ගේ හැකියා වර්ධනය

තාක්ෂණික පුහුණු වැඩසටහන :

NEDA පනත සහ සංස්ථා සැලස්ම පරිදි, NEDA තාක්ෂණික වුවමාරුව සහ ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් සමඟ සම්බන්ධ වේ. වර්තමානයේදී, ජනතාවගෙන් වැඩි පිරිසක් කාර්මික නිපුණතාවයන් නැතිවම ව්‍යාපාර හෝ ආදායම් උපදවන කාර්යයන්ගේ නිරත වෙමින් සිටින අතර ඔවුන්ගේ නිෂ්පාදනයන්ගේ ගුණාත්මකභාවය ඉතා අඩුය. මෙනිසා, NEDA විසින් ඔවුන්ගේ තාක්ෂණික දැනුම සහ නිපුණතාවයන් වර්ධනය කිරීම සඳහා තාක්ෂණික පුහුණු වැඩසටහන් පැවැත්වීමට තීරණය කර ඇත.

NEDA දේශීය තරගකාරී ලාභ වැඩසටහන් සහ ක්ෂේත්‍ර නිරීක්ෂණයන් තුළින් තාක්ෂණික පුහුණු අවශ්‍යතාවයන් හඳුනාගෙන ඇත.

පහත වගුවේ දී ඇති විවිධ කලාපයන් තුළ තාක්ෂණික පුහුණු වැඩසටහන් නවයක් NEDA විසින් ක්‍රියාත්මක කර ඇත.

පුහුණු වැඩ සටහන්	ස්ථානය	ප්‍රතිලාභීන් සංඛ්‍යාව
ආහාර සැකසීම	මඩකලපුව දිස්ත්‍රික්කය තුළ වාලච්චනෙයි, ඔඩ්ඩමාවඩි, කලවංචිකුඩි, අරයම්පති සහ වෙල්ලාවේලි. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ මුතූර්	151 60
ඇඳුම් මැසීමේ වැඩසටහන	ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ මුතූර් සහ කින්නියාව	165
මුළු ගණන		**376**

NEDA විසින් මඩකලපුව දිස්ත්‍රික්කය තුළ කොහු හා කොහු ආශ්‍රිත නිෂ්පාදකයන් සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ භාවිතා කරන නව තාක්ෂණය හඳුනා ගැනීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහයෝගයෙන් කුරුණෑගලට අනාවරණ චාරිකාවක් සංවිධානය කරන ලදී. මේ සඳහා කොහු හා කොහු ආශ්‍රිත නිෂ්පාදකයන් පනස් දෙනෙක් සහභාගි කරවන ලදී.

ඊට අමතරව, මහනුවර දිස්ත්‍රික්කය තුළ අත්කම් අංශයේ වත්මන් උපනතීන් සහ ප්‍රමිතීන් පිළිබඳව වැඩමුළුවක් ක්‍රියාත්මක කර ඇත. අදාළ පුද්ගලික, රාජ්‍ය ආයතන සහ අත්කම් ව්‍යවසායකයන් මෙම වැඩමුළුව සඳහා සහාභාගි කරවන ලදී. මෙම වැඩමුළුවේ පරමාර්ථය වූයේ ව්‍යවසායකයන්ට වත්මන් උපනතීන් සහ ප්‍රමිතීන් පිළිබඳව දැණුවත් කිරීම වන අතර මෙම වැඩමුළුව NEDA ආයතනයේ උපදේශකත්වය යටතේ මහනුවර දිස්ත්‍රික් වාණිජ මණ්ඩලය විසින් සංවිධානය කරන ලදී.

ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන :

සංස්ථාපිත සැලැස්ම පරිදි, NEDA විසින් ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලයේ සහ දිස්ත්‍රික් වාණිජ මණ්ඩලවල සහයෝගයෙන් කලාපීය මට්ටමින් කුඩා සහ මධ්‍යම පරිමාණ ව්‍යවසායකයන් සඳහා ව්‍යාපාර සංවර්ධන පුහුණු වැඩසටහන් පවත්වා ඇත.

වැඩසටහනේපරමාර්ථයන්:

- ඔවුන්ගේ නිෂ්පාදන සහ සේවාවන්ගේ ගුණාත්මකභාවය හා ඵලදායිතාව වර්ධනය කිරීම
- සහාභාගිවන්නන්ගේ ව්‍යවසායකත්ව නිපුණතාවයන් වර්ධනය කිරීම
- ඔවුන්ගේ ලාභයන් වැඩි කිරීම
- සහාභාගිවූවන් ව්‍යාපාර ජාලයට අනාවරණය කරනු ලැබීම.

- කළමනාකරණ නිපුනතාවයන් වර්ධනය කිරීම
- මූල්‍ය කළමනාකරණය වර්ධනය කිරීම

කළමනාකරණ සහ කාර්මික නිපුණතාවයන් වර්ධනය කිරීමේ අරමුණින් සුදුසු ස්ථානයන්හිදී විධිමත් පුහුණු වැඩ සටහන් තුළින් පුහුණුකිරීම් ලබාදෙන ලදී.

පුහුණු වැඩසටහන්	ස්ථානය	ප්‍රතිලාභීන් සංඛ්‍යාව
අලෙවිකරණය සහ පාරිභෝගිකයන්	පොලොන්නරුව දිස්ත්‍රික්කය තුළ හිඟුරක්ගොඩ	35
ගුණාත්මකභාවය සහ ඵලදායිතාවය	පුත්තලම දිස්ත්‍රික්කය තුළ හලාවත	35
මානව සම්පත් කළමනාකරණය	රත්නපුර	24
මානව සම්පත් කළමනාකරණය	පුත්තලම දිස්ත්‍රික්කය තුළ හලාවත	22
නිෂ්පාදන පිරිවැයකරණය සහ මිලකරණය	අනුරාධපුර	25
මානව සම්පත් කළමනාකරණය	කුරුණෑගල	30
මානව සම්පත් කළමනාකරණය	අනුරාධපුර	29
මූල්‍ය තීරණ ගැනීම, බදුකරණය සහ ගිණුම්කරණය	කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ඇහැටුවැව	36
මුළු ගණන		**236**

"දිවි නැගුම" ජාතික වැඩ සටහන:

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය සහ සාම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය විසින් "දිවිනැගුම" ජාතික වැඩසටහන යටතේ "දිවිනැගුම" කුටි කර්මාන්ත පර්ෂද ප්‍රවර්ධන ප්‍රදර්ශන සංවිධානය කරමින් සිටී. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් මෙම ප්‍රදර්ශන සඳහා දායකවීමට ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියට ආරාධනා කර ඇත. මෙම ප්‍රදර්ශනය සියළුම දිස්ත්‍රික්කයන් (දිස්ත්‍රික් 21) තුළ සහ මෙම වර්ෂයේදී ප්‍රදර්ශන 13ක් සඳහා සැලසුම් කර ඇත.

මෙම වර්ෂය තුළ සාම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය විසින් සංවිධානය කළ සියළුම ප්‍රදර්ශනයන්ට (ප්‍රදර්ශන 7) NEDA සහභාගි වී ඇත. එමෙන්ම, NEDA විසින් "දිවිනැගුම" ප්‍රතිලාභීන් පුහුණු කිරීමේ සහ පහසු කිරීමේ වැඩසටහනටද සම්බන්ධ කරවන ලදී. අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් 9 දෙනෙක් සඳහා කිරි හා කුකුළු පාලනය සහ ආහාර සැකසීමේ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

හඳුන් කූරු නිෂ්පාදනය

රුපියල් මිලියන 300ක වාර්ෂික වියදමක් දරමින් ප්‍රධාන වශයෙන් වර්තමානයේ ඉන්දියාවෙන් ආනයනය කරනු ලබන හඳුන්කූරු නිෂ්පාදනය ශ්‍රී ලංකාව තුළ ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් NEDA විසින් පාර්ශ්වකරුවන් සඳහා වැඩමුළු පැවැත්විය. දේශීය හඳුන්කූරු නිෂ්පාදනයට පහසුකම් සැපයීමේ අරමුණින් පහත කාර්යයන් සිදුකරන ලදී.

01. සෙස් බද්ද වැඩිකිරීම
02. තාක්ෂණික පුහුණු වැඩසටහන් පැවැත්වීම
03. අමුද්‍රව්‍ය නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම (අගුරු කුඩු, උණගස් කූරු යනාදිය)
04. අතින් ක්‍රියාත්මක කලහැකි හඳුන්කූරු යන්ත්‍රයක් නිපදවීමේ යෝජනාව

04. ජාතික සංවර්ධන වැඩසටහන් සඳහා දායකත්වය

"දැයට කිරුළ" ප්‍රදර්ශනය:

NEDA විසින් අනුරාධපුර පැවැති **"දැයට කිරුළ"** ජාතික ප්‍රදර්ශනය - 2012 සඳහා සම්බන්ධ විය. NEDA විසින් අනුරාධපුර දිස්ත්‍රික් වාණිජ මණ්ඩලයේ සහයෝගිත්වයෙන් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමින් ග්‍රාමීය ව්‍යවසාය සංසද 11ක් පිහිටුවා ඇති අතර අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ ව්‍යවසායකයන් 71 දෙනෙක් සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන් තුනක් පවත්වන ලදී. (තඹුත්තේගම සහ නුවරගම්පලාත ප්‍රා.ලේ.කොට්ඨාශ) ප්‍රාදේශිය මට්ටමේ ව්‍යවසාය සංසද 11ක්ද පිහිටුවන ලදී.

NEDA 2011 වර්ෂයේදී බුත්තල පැවති **"දැයට කිරුළ"** ජාතික ප්‍රදර්ශනයටද සහභාගි වූ අතර පැමිණි ජනතාව ව්‍යාපාරයන්හී නියුක්තකිරීම පෙළඹවීම සඳහා වීදි නාට්‍ය රඟ දක්වන ලදී.

4.1 ශ්‍රී ලංකාව තුළ නව්‍යකරණ ව්‍යාපාර සංස්කෘතිය පෝෂණය කිරීම

තාක්ෂණික සංවර්ධන අරමුදල :

NEDA පනතේ විධිවිධාන අනුව, ශ්‍රී ලංකාව තුළ තාක්ෂණික සංවර්ධන අරමුදලක් (TDF) ස්ථාපිත කිරීම සඳහා NEDA විසින් කැබිනට් පත්‍රිකාවක් සකස්කර එය කර්මාන්ත සහ වාණිජ අමාත්‍යංශය වෙත ඉදිරිපත් කර ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, තාක්ෂණික වුවමාරුව තුළින් පර්යේෂණ වාණිජකරණය කිරීමේ ක්‍රියාකාරී කණ්ඩායමක් ස්ථාපිත කරන ලදී. ඒ සමඟම, NEDA විසින් මැලේසියානු තාක්ෂණික සංවර්ධන සහයෝගීතාවයෙන් තාක්ෂණික සහයෝගය ලබාගැනීමේ සක්‍යතාවය ගවේශණය කරන ලදී. MTDC විසින් ශ්‍රී ලංකාව තුළ තාක්ෂණික සංවර්ධන අරමුදලක් ස්ථාපිත කිරීමේ ශක්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කරන ලද අතර එය පසුව නිර්දේශයන් සඳහා ක්‍රියාකාරී කණ්ඩායමට ඉදිරිපත් කරන ලදී.

05. පර්ෂද ප්‍රවේශය තුළින් කර්මාන්තයේ තරගකාරිත්වය වර්ධනය කිරීම

මොරටුව දැව භාණ්ඩ පර්ෂද සංවර්ධන වැඩ සටහන

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA) විසින් 2006 අංක 17 දරණ NEDA සංස්ථාගත කිරීමේ පනතේ 12 වගන්තියේ (1) උප වගන්තිය සහ 14 වගන්තියේ (උ) යටතේ මොරටුව දැව පර්ෂදය සහ වේවැල්දෙනිය වේවැල් පර්ෂදය විශේෂ ආර්ථික කලාපයන් (SEZs) වශයෙන් ප්‍රකාශයට පත් කිරීම සඳහා කටයුතු ආරම්භ කරන ලදී.

මෙහි අරමුණ වූයේ ව්‍යාපාර පරිසරය වැඩි දියුණු කිරීම තුළින් ගෝලීය පර්ෂද මග එහි භූගෝලීය ව්‍යවසාය පර්ෂද සංවර්ධන වැඩසටහය යටතේ එම පර්ෂදයන් ගෝලීය තරගකාරී ව්‍යවසාය පර්ෂදයන් වශයෙන් ප්‍රදේශීය ආර්ථික පාලනය සහ ව්‍යාපාර සම්බන්ධතාවයන් සංවර්ධනය කිරීමයි.

මෙම වැඩසටහන තුළින් පර්ෂද ව්‍යාපාරික ආයතනයන් ප්‍රදේශය මත පදනම්ව තරගකාරී ව්‍යවසායක් වශයෙන් නිර්මාණය කිරීම සඳහා සංවර්ධනය කරනු ලබන අතර ප්‍රදේශගත ව්‍යාපාර තුළ සහ ව්‍යාපාර අභ්‍යන්තරයේ ව්‍යාපාර සම්බන්ධතාවයන් සන්නද්ධ කිරීම මගින් සංවර්ධන ප්‍රතිලාභයන් තිරසාර කරගැනීමට ව්‍යවසායකත්ව සංවර්ධනය ප්‍රවර්ධනයකර පහසුකම් සපයයි.

NEDA විසින් මොරටුව අවිධිමත් භූගෝලීය පර්ෂදයක් වශයෙන් හඳුනාගෙන ඇති අතර දැනටමත් කර්මාන්ත ගම් සංවර්ධන වැඩසටහන යටතේ රජය විසින් කරගෙන යනු ලබන සංවර්ධන වැඩ සංවර්ධන කොටස්කරුවන් සමඟ පුළුල් කිරීම මඟින් සංවිධිත පර්ෂදයක් වශයෙන් එය සංවර්ධනය කිරීමට සැලසුම් කර ඇත

NEDA විසින් 2011 වර්ෂය තුළ පහත සඳහන් කාර්යයන් නිම කර ඇත

- **NCCI** සහයෝගිත්වයෙන් මොරටුව දැව පර්ෂදය සඳහා ස්වසාධන පොදු සංගමයක් වශයෙන් දැව ඉරුම් මෝල්කරුවන්ගේ සංගමය, ලී වැඩපොල හිමිකරුවන්ගේ සංගමය සහ ගෘහ භාණ්ඩ සාප්පු හිමිකරුවන්ගේ/වෙළඳුන්ගේ සංගමය යන සංගම් තුන එකතු කරමින් මොරටුව එක්සත් දැව ගෘහභාණ්ඩ සංගමය පිහිටුවීම.
- නගර සැලසුම්කරුවන්ගේ සංගමය විසින් ඉදිරිපත් කරන ලද මොරටුව හා වේවැල්දෙනිය පර්ෂදයන්ගේ විශේෂ දත්ත පදනම් සංවර්ධනය පිළිබඳ අවසන් වාර්ථාව තාක්ෂණික ඇගැයීම් කමිටුව සමග ඇගැයීම.
- පාර්ශ්වකරුවන්ගෙන් තොරතුරු විමසීමෙන් මොරටුව දැව භාණ්ඩ පර්ෂදය සංවර්ධනය කිරීම සඳහා කළමනාකරණ සමාගමක් පිහිටුවීමට කටයුතු ආරම්භ කරනු ලැබීම.
- ප්‍රකෝනි මහතා නියෝජනය කරනු ලබන ඔස්ට්‍රියාවේ වැම් **(VAM)** ආයතනයේ සහයෝගයෙන් කටුබැද්ද පිහිටි ලී වැඩ පුහුණු මධ්‍යස්ථානය ජාත්‍යන්තර මට්ටමට උසස් කිරීම සඳහා ව්‍යාපෘති යෝජනාවක් විකාශය කිරීම කෙරෙහි රැස්වීමක් ලක්සල, රාජ්‍ය දැව සංස්ථාව, ජාතික ශිල්ප සභාව (NCCC), තොරතුරු තාක්ෂණ ආයතනය (ITI) සහ කර්මාන්ත අමාත්‍යාංශය සමග රැස්වීමක් පිළියෙල කිරීම.

- මොරටුව දැව භාණ්ඩ පර්ෂද ප්‍රදේශය විශේෂිත ආර්ථික කලාපයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමේ ගැසට් නිවේදනය කර්මාන්ත සහ වාණිජ අමාත්‍යාංශයට කෙටුම්පත් කිරීම.
- පර්ෂද සංවර්ධනය සඳහා සංවර්ධන කොටස්කරුවන් හඳුනාගෙන ඔවුන් සමග මූලික සාකච්ඡාවන් සිදුකිරීම.
- ශ්‍රී ලංකා ජාතික ශිල්ප සභාවේ සහයෝගයෙන් මොරටුව එක්සත් දැව භාණ්ඩ සංගමය ලියාපදිංචිකිරීම සඳහාවන මූලික කටයුතු නිම කරනු ලැබීම.
- සංවර්ධන කොටස්කරුවන්ගේ සංසදය මොරටුව විශ්ව විද්‍යාලය, IDB සහ SEEDS හි පවත්වන ලදී. මෙම සංසදයේදී ගනු ලැබූ තීරණයන් මත පදනමව NEDA විසින් සකස්කරන ලද පර්ෂද සංවර්ධන වැඩසටහනේ අදාළ අංගයන් ක්‍රියාත්මක කිරීමට සංවර්ධන කොටස්කරුවන් සමග අත්සන් කළයුතු අවබෝධතා ගිවිසුම සකස් කිරීම සඳහා පියවර ගනිමින් සිටීම.
- ගෘහ භාණ්ඩ පර්ෂද සංවර්ධනයේදී සහ අවබෝධතා ගිවිසුම් සඳහා තොරතුරු හඳුනා ගැනීමේදී පවතින පොදු ප්‍රශ්න සාකච්ඡා කිරීම සඳහා ගෘහ භාණ්ඩ පර්ෂද සංවර්ධන කොටස්කරුවන් සහ මොරටුව එක්සත් දැව ගෘහ භාණ්ඩ සංගමය සමග එක් දින වැඩමුළුවක් පැවැත්වීම.
- බිංගිරිය, ගම්පහ, දන්කොටුව, මීගමුව සහ කුලියාපිටිය යන නගරවල කුඩා ගෘහ භාණ්ඩ ප්‍රදර්ශන පහක් (05) පැවැත්වීම.

වේවැල්දෙනිය පර්ෂද සංවර්ධන වැඩ සටහන:

NEDA විසින් වේවැල්දෙනිය අවිධිමත් භූගෝලීය පර්ෂදයක් වශයෙන් හඳුනාගෙන ඇති අතර දැනටමත් කර්මාන්ත ගම් සංවර්ධන වැඩසටහන යටතේ රජය විසින් කරගෙන යනු ලබන සංවර්ධන වැඩ සංවර්ධන කොටස්කරුවන් සමඟ පුළුල් කිරීම මඟින් සංවිධිත පර්ෂදයක් වශයෙන් එය සංවර්ධනය කිරීමට සැලසුම් කර ඇත.

NEDA විසින් **සණස** බැංකුව සංවර්ධන කොටස්කරු වශයෙන් හා එහි තාක්ෂණික හා මූල්‍ය සහය වේවැල්දෙනිය වේවැල් පර්ෂදය තුළ NEDA විසින් කරගෙන යනු ලබන සංවර්ධන මූල්පිරීම් කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමට යෙදවීම සඳහා තෝරාගෙන ඇත. මේනිසා, සංවර්ධන කාර්යභාරයන් පැවරීමට සහ සංවර්ධන කොටස්කරුවන් වන NEDA සහ **සණස** බැංකුවේ කාර්යයන් සහ වගකීම් නීර්ණය කිරීම සඳහා NEDA විසින් **සණස** බැංකුව සමග අවබෝධතා ගිවිසුමක් (MOU) අත්සන් කිරීමට අපේක්ෂා කරයි.

කොහු පර්ෂද සංවර්ධන වැඩසටහන :

වයඹ පළාතේ කොහු කර්මාන්තය රටේ ප්‍රධානතම තරඟකාරී ව්‍යාපාරයන්ගෙන් එකකි. රටේ පොල් වගාවෙන් සියයට 45 ට වඩා වයඹ පළාතේ ඇති අතර රටේ මෝල්වලින් සියයට 85ට වඩා වයඹ සහ බස්නාහිර පළාතේ ඇත. පොල් ලෙලිවලින් මූලික අමුද්‍රව්‍ය ලබා ගන්නා කොහු කර්මාන්තය ලෝක වෙළඳපළේ තරඟකාරී කර්මාන්තයක් බවට පත්ව ඇති අතර ලෝක වෙළඳපළට නව

තරඟකරුවන් පිවිසීමත්, අපනයන ඇණවුම් ඉටුකිරීමේ අපහසුතා (පොල් ලෙලි අඩුවෙන් තිබීම, අමුද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමේ තාක්ෂණික ගැටළු සහ කල් ඉකුත්ව ගිය යන්ත්‍ර සූත්‍ර), ආදළ පාර්ශවයන් අතර සම්බන්ධතා බිඳ වැටීම සහ සේවා නියුක්තියට එහි ඇති අඩු දායකත්වය වැනි අභියෝග කිහිපයකට මුහුණ දෙයි.

NEDA උපාය මාර්ගික සැලසුම අනුව, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය කර්මාන්තවල පාර්ශ්වකරුවන් එකතු කිරීමට සහ ඔවුන් (අපනයනය සහ බෙදාහැරීම, නිෂ්පාදනය සහ සම්පත් සැපයීම හා සම්බන්ධ සියළුම පාර්ශ්වයන්) අතර සම්බන්ධීකරණය වැඩි කිරීමට ප්‍රයත්න දරයි. NEDA විසින් පාර්ශ්වකරුවන් අතර සම්බන්ධීකරණය වැඩි දියුණු කිරීම සඳහා කොහු සම්මේලන වැඩ සටහන පවත්වා ඇත. තවද, NEDA විසින් රාජ්‍ය වැවිලි සහ පෞද්ගලික වැවිලි සමාගම්වල අයිතිකරුවන්, පොල් සංවර්ධන අධිකාරිය (CDA), පොල් පර්යේෂණ ආයතනය (CRI), පොල් වගා කිරීමේ මණ්ඩලය(CCB) සහ වෙනත් අදාළ රජයේ සහ පෞද්ගලික අංශයේ සංවිධානයන් සමග පාර්ශ්වකරුවන්ගේ රැස්වීමක් පවත්වා ඇති අතර අනාගත ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සඳහා නියෝජ්‍ය පොලිස්පති (DIG), කර්මාන්ත සංවර්ධන මණ්ඩලය (IDB), අපනයන සංවර්ධන මණ්ඩලය(EDB), පොල් වගා කරුවන් සහ අදාළ වෙනත් ආයතනයන් වැනි අදාළ රජයේ නිලධාරීන් කැඳවීමට තීරණය කර ඇත.

අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත සංවර්ධන වැඩසටහන :

මඩකලපුව දිස්ත්‍රික්කයේ යුද්ධයෙන් පීඩිත අත් යන්ත්‍ර රෙදි වියන්නන් අතර බෙදාදීම සඳහා අත් යන්ත්‍ර මැෂින් 70ක් නිෂ්පාදනය කිරීමට කටයුතු කර ඇත. NEDA විසින් වර්ණ ගැන්වීම සහ මෝස්තර නිර්මාණය, ව්‍යාපාර සංවර්ධනය සහ නිෂ්පාදන වැඩි දියුණු කිරීම යන ක්ෂේත්‍රයන්ගේ හැකියාවන් වර්ධනය කිරීමේ වැඩසටහන මඩකලපුව දිස්ත්‍රික්කයේ අත්යන්ත්‍ර රෙදි වියන්නන් 90ක් සඳහා පවත්න ලදී. මෙය පාලමුනෙයි සහ මරතමුනෙයිහිදී 2010 වර්ෂය තුල පැවැති ගැණුම්කරුවන්ගේ සහ විකුණුම්කරුවන්ගේ රැස්වීමට ප්‍රතිචාරයක් වශයෙන් සිදු කරන ලදී.

06. ව්‍යවසායකයන් සහ ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් මුණ ගැස්වීම

ව්‍යාපාර සංවර්ධන සේවා පොළවල්:

කුඩා හා මධ්‍ය පරිමාණ අංශය ප්‍රාදේශිය මට්ටමින් සංවර්ධනය කිරීමේ අරමුණින් NEDA විසින් එහි ආයතණික සැලැස්ම අනුව, ව්‍යාපාර වෙළඳපලවල් සහ BDS සපයන්නන්ගේ සේවා පොලවල් ක්‍රියාත්මක කරන ලදී. සමස්ථ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් විසින් ප්‍රාදේශිය මට්ටමින් සහ රටතුළ ලබාගත හැකි ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් (BDS) පිළිබඳව මෙන්ම ඔවුන් විසින් සපයනු ලබන කාර්යයන් සහ සේවාවන් පිළිබඳව දැනුවත්කම නොමැති බැවින් සහ ඒ නිසාම ඔවුන්ගෙන් උපරිම සේවයක් ලබා ගැනීමට අසමත්

වී ඇති බව NEDA විසින් හඳුනා ගෙන ඇත. ව්‍යවසායකයන් සහ (BDS) සපයන්නන් අතර පරතරය අඩු කිරීමේ අරමුණින්, ශක්තිමත් සම්බන්ධතාවයන් සහ මැදිහත්වීම් නිර්මාණය කළ යුතුය. ව්‍යාපාර සේවා වෙළඳපලවල් BDS සපයන්නන්ගෙන් උපරිම සේවාවන් ලබාගැනීම සඳහා කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයන් සහ BDS සපයන්නන් අතර පාලමක් නිර්මාණය කරන අතර ඒ නිසාම දියුණු කල හැකි ව්‍යවසායකයන්ගේ ව්‍යවසායකත්ව හැකියාව වර්ධනය වේ.

2011 වර්ෂයේදී NEDA විසින් ව්‍යාපාර සංවර්ධන සේවා පොලවල් මඩකලපුව සහ අනුරාධපුර දිස්ත්‍රික්ක තුළ පවත්වා ඇත.

දේශීය ව්‍යාපාර ජාත්‍යන්තරකරණය කිරීම - තාක්ෂණයන්, යන්ත්‍ර සහ උපකරණයන් වෙත ප්‍රවේශවීම:

එක් සැසියකට නරඹන්නන් 600,000කට වැඩියෙන් නරඹන ලද චීනයේ ගුහැන්ග්සෝහිදි (Guangzhou) පැවැත්වූ තාක්ෂණය, යන්ත්‍ර සහ උපකරණ ප්‍රදර්ශනය කරන ජාත්‍යන්තර ආනයන සහ අපනයන පොල සඳහා NEDA විසින් ව්‍යවසායකයන් 37 දෙනෙක් සංවිධානය කිරීම.

ව්‍යාපාර සංවර්ධන සේවාවන් සපයන්නන් ශක්තිමත් කිරීම:

NEDA ආයතණික සැලැස්ම අනුව, ව්‍යාපාර සංවර්ධන සේවා (BDS) සපයන්නනන්ගේ ජාතික නාමාවලිය සකස් කිරීම සහ ප්‍රකාශයට පත් කිරීම ඇතුළත්ය. ව්‍යාපාර සංවර්ධන සේවාවන් සපයන්නන්ට කාර්ය නියුතු ව්‍යවසායකයන් සඳහා සේවාවන් සැපයීමේ ප්‍රධාන භූමිකාව අයත් වේ. විවිධ වර්ගයේ BDS සපයන්නන් කුඩා හා මධ්‍ය පරිමාණ අංශයේ සංවර්ධනය සමග සම්බන්ධ වී සිටින අතර ප්‍රධාන වශයෙන් අලෙවි කිරීම, තාක්ෂණික සංවර්ධනය සහ වුවමාරුව, මූල්‍ය, ව්‍යවසායකත්ව සංවර්ධනය, තොරතුරු තාක්ෂණය යනාදීයේදී සහාය වේ.

පියවර පහකින් ඉහත වැඩසටහන කරගෙන යාම සඳහා **NEDA** සැලසුම් කර ඇත.

1. NEDA යටතේ ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් ලියාපදිංචි කිරීම
2. ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන්ගේ ජාතික නාමාවලියක් සකස් කිරීම (මෘදු පිටපත)
3. ජාතික නාමාවලිය ප්‍රකාශයට පත් කිරීම
4. ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් තක්සේරු කිරීමේ අවශ්‍යතාවය
5. ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් ශක්තිමත් කිරීම

1. NEDA යටතේ ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් ලියාපදිංචි කිරීම

NEDA විසින් රටතුළ සිටින සියළුම වර්ගයේ BDS සපයන්නන් ලියාපදිංචි කිරීමට සැලසුම් කර ඇති අතර ඔවුන් පුවත්පත් දැන්වීම් මගින් දැණුවත් කරයි. එයට අමතරව, සියළුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් වෙත ලිපි සහ ලියාපදිංචිවීමේ ආකෘති පත් යැවීම තුළින් දැණුවත් කෙරේ.

2. ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන්ගේ ජාතික නාමාවලියක් සකස් කිරීම

NEDA ආයතනය යටතේ ලියාපදිංචි BDS සපයන්නන්ගෙන් තොරතුරු රැස් කරනු ලබන අතර, ඔවුන්ගේ සාමාන්‍ය තොරතුරු හා සේවාවන් සැලකිල්ලට ගනු ලැබේ. මෙම BDS සපයන්නන්ගේ තොරතුරු ඉදිරිපත් කිරීම සඳහා විශේෂිත ආකෘතියක් භාවිතා කෙරේ. මෙම නාමාවලිය ව්‍යවසායකයන් සඳහා ඉතා අත්‍යවශ්‍ය වන අතර ප්‍රාදේශීය මට්ටමින් ලබගත හැකි BDS සපයන්නන් සහ ඔවුන්ගේ

සේවාවන් සම්බන්ධයෙන් ව්‍යවසායකයන් දැණුවත් කරයි.

3. ජාතික නාමාවලිය ප්‍රකාශයට පත් කිරීම

NEDA විසින් මෙම නාමාවලිය අත් පොතක් වශයෙන් සකස් කිරීමට සහ මෙම නාමාවලිය ප්‍රාදේශිය මට්ටමින් වැඩසටහන් දියත් කරමින් ප්‍රකාශයට පත් කිරීමට සැලසුම්කර ඇත. මූලික අදියරයේදී අත් පිටපත් 5000ක් (සිංහල සහ දෙමළ) සකස් කිරීමට සහ BDS සපයන්නන් මෙන්ම ව්‍යවසායකයන් අතර බෙදා හැරීමට NEDA අපේක්ෂා කෙරේ.

4. ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් තක්සේරු කිරීමේ අවශ්‍යතාවය

NEDA විසින් BDS සපයන්නන්ගේ මානව සම්පත කෙරෙහි අවධානය යොමු කරමින් සුදුසු ආකෘතියක් තුළින් BDS සපයන්නන් පිළිබඳ අවශ්‍ය තක්සේරු කිරීමක් සිදු කිරීමට සහ මෙම තොරතුරු විශ්ලේෂණය කිරීම මගින් මානව සංවර්ධනයේ අවශ්‍යතාවයන් හඳුනා ගැනීමට අපේක්ෂා කෙරේ.

5. ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් ශක්තිමත් කිරීම

අවශ්‍ය තක්සේරු ප්‍රතිඵල මත පදනම්ව, NEDA විසින් ව්‍යාපාර සංවර්ධන සේවා සපයන කාර්යය මණ්ඩලය සඳහා හැකියා සංවර්ධන වැඩසටහන තීරණය කෙරේ. 2011 වර්ෂයේදී, NEDA විසින් ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන්ගෙන් ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පත් කැඳවා ඇත

07. විශේෂ ව්‍යාපෘතින්

“හැකියාවට රැකියාව ” වැඩසටහන:

NEDA විසින් උතුරු හා නැගෙනහිර රැකියා විරහිත තරුණයන් සහ අවශ්‍ය සේවා යෝජකයන් හඳුනා ගැනීම සඳහා ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී. "හැකියාවට රැකියාවක්" වැඩසටහන යටතේ කලාපයේ දිස්ත්‍රික්ක තුළ රැකියා පොලවල් පැවැත්වීම මගින් සුදුසු තරුණයන් අවශ්‍ය සේවා යෝජකයන් වෙත හඳුන්වා දෙනු ලැබේ. ආයෝජන මණ්ඩලයේ (BOI) සහයෝගිතාවයෙන් NEDA විසින් කටුනායක වෙළඳ කලාපය තුළින් 2000කට ආසන්න රැකියා අවස්ථාවන් හඳුනාගන්නා ලදී. කෙසේවෙතත්, මන්නාරම දිස්ත්‍රික්කයේ රැකියා විරහිත තරුණයන් හඳුනා ගැනීමේ පළමු උත්සාහය ඔවුන් දිස්ත්‍රික්කයෙන් බැහැරවීමට ඇති අකැමැත්ත හේතුවෙන් අසාර්ථක විය. එමනිසා, තරුණයන් දිස්ත්‍රික්කයෙන් බැහැරවීමට ඇති කැමැත්ත/ අකැමැත්ත පිළිබඳ මූලික අධ්‍යයනයක් කිරීමෙන් පසු මෙම වැඩ සටහන නැවත වතාවක් සිදුකරනු ලැබේ.

යුද්ධයෙන් පීඩිත ව්‍යාපාර නගාසිටුවීම:

උතුරු හා නැගෙනහිර පලාත්වල යුද්ධයෙන් පීඩිත කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයන් පිළිබඳව තොරතුරු එක්රැස් කිරීම සඳහා පුවත්පත්වල දැන්වීමක් ප්‍රකාශයට පත් කරන ලදී. හැකියාවක් ඇති දානපතියන්ගේ සහයෝගය සඳහා යෝජනාව සකස් කිරීමට උපදේශකයන් විසින් ස්වේච්ඡාවෙන් කටයුතු කරන ලදී. උතුරු හා නැගෙනහිර දිස්ත්‍රික් මට්ටමින් තෝරාගත් පීඩිත ව්‍යාපාරයන්ගෙන් ඉල්ලුම්පත් 2700ක් ලැබී තිබුණි.

2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය

	සටහන	2011	2010
		රු.	රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල, පිරියත සහ උපකරණ	**10**	6,600,495.42	3,133,495.28
ජංගම වත්කම්			
අත්තිකාරම්වලින් ගෙවීම		15,000.00	15,000.00
අත්තිකාරම්		228,800.00	70,000.00
මුදල් සහ බැංකු ශේෂය		1,998,625.12	1,937,086.86
උත්සව අත්තිකාරම්		12,000.00	11,000.00
කාර්යාලීය කුලිය මත තැන්පතු		799,380.00	
පෙර ගෙවීම	**11**	84,164.86	
		9,738,465.40	**5,166,582.14**
කොටස් ප්‍රාග්ධනය සහ වගකීම්			
ප්‍රාග්ධන දායකත්වය	**12**	13,229,838.47	9,510,429.65
සමුච්චිත ලාභය/ (අලාභය)		(4,948,495.54)	(3,148,528.05)
වර්ෂය තුළ ලාභය/ (අලාභය)		507,710.61	(1,799,967.49)
		8,789,053.54	4,561,934.11
ජංගම නොවන වගකීම්			
පාසල් තරගය වෙනුවෙන් **BOC** ලැබීම්		53,010.58	128,010.58
ජංගම වගකීම්			
උපචිත වියදම්	**13**	896,401.28	476,637.45
මුළු කොටස් ප්‍රාග්ධනය සහ වගකීම්		**9,738,465.40**	**5,166,582.14**

එන්.එම්. ෂහීද්
සභාපති/ අධ්‍යක්ෂ ජනරාල්

කේ.බී.ලියනගේ
ගණකාධිකාරී

2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ආදායම් සහ වියදම් ප්‍රකාශනය

	සටහන	2011	2010
		රු.	රු.
ආදායම			
මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු පුනරාවර්තන		19,464,000.00	8,920,000.00
වෙනත් ආදායම්	**1**	126,525.86	5,505.72
වර්ෂය සඳහා වෙනස් වූ ප්‍රාග්ධන ප්‍රදාන		21,305,591.18	10,195,518.12
මුළු ආදායම		**40,896,117.04**	**19,121,023.84**
අඩුකළා :- මෙහෙයුම් වියදම්			
සේවක පාරිශ්‍රමික	**2**	8,421,367.12	6,035,129.56
පරිපාලන වියදම්	**3**	8,257,656.80	2,747,591.41
ගමන් වියදම්	**4**	377,061.24	669,341.50
නඩත්තු වියදම්	**5**	582,954.20	97,554.08
සැපයීම් සහ පරිභෝජනයන්	**6**	1,421,046.00	1,135,581.49
ක්ෂය කිරීම්	**7**	1,976,812.49	1,387,942.49
සංවර්ධන වියදම්	**8**	19,328,778.69	8,807,576.63
මුළු මෙහෙයුම් වියදම්		**40,365,676.54**	**20,880,717.16**
මෙහෙයුම් කාර්යයන්ගෙන් අතිරික්තය/ (හිඟය)		530,440.50	(1,759,693.32)
අඩුකළා :-මූල්‍ය වියදම්	**9**	22,729.89	40,275.17
කාලසීමාව සඳහා ශුද්ධ අතිරික්තය/ (හිඟය)		**507,710.61**	**(1,799,968.49)**
එකතුකළා :-			
පෙර වර්ෂය සඳහා අතිරික්තය / (හිඟය)		(4,948,495.54)	(9,462,092.25)
අඩුකළා :- පෙර වර්ෂයේ ගැලපීම්			6,313,564.20
ශුද්ධ අතිරික්තය/ (හිඟය) ඉදිරියට ගෙනගියා		**(4,440,784.93)**	**(4,948,495.54)**

2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	සටහන	2011	2010
		රු.	රු.
මෙහෙයුම් ක්‍රියාවලියෙන් මුදල් ප්‍රවාහ			
අතිරික්තය/ හිඟය)		507,710.61	(1,799,967.49)
මුදල් නොවන සංසරණ			
උපචිත වියදම්		419,763.83	(6,164,787.55)
ක්ෂය කිරීම		1,976,812.49	
පෙර වර්ෂයේ ගැලපීම්		-	6,313,564.20
අත්තිකාරම්		(158,800.00)	(70,000.00)
උත්සව අත්තිකාරම්		(1,000.00)	(7,000.00)
අත්තිකාරම්වලින් ගෙවීම		-	
කාර්යාලීය කුලිය මත තැන්පතු		(799,380)	
පෙර ගෙවීම්		(84,164.86)	
මෙහෙයුම් කාර්යයන්ගෙන් ශුද්ධ මුදල් ප්‍රවාහයන් (අ)		**1,860,942.07**	**(1,728,190.84)**
ආයෝජන කාර්යයන්ගෙන් මුදල් ප්‍රවාහයන්			
ස්ථාවර වත්කම් මිලදී ගැනීම		(5,443,812.63)	(250,557.16)
ආයෝජන කාර්යයන්ගෙන් ශුද්ධ මුදල් ප්‍රවාහයන් (ආ)		**(5,443,812.63)**	**(250,557.16)**
මූල්‍ය කටයුතුවලින් මුදල් ප්‍රවාහය			
භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධන ප්‍රදාන		25,025,000.00	9,600,000.00
පාසල් තරගය සඳහා ලැබුණු BOC ගෙවීම		(75,000.00)	
ප්‍රාග්ධන ප්‍රදාන මත ගෙවන ලද සංවර්ධන වියදම්		(21,305,591.18)	(8,807,575.63)
මූල්‍ය කාර්යයන්ගෙන් ශුද්ධ මුදල් ප්‍රවාහයන් (ඇ)		**3,644,408.82**	**792,424.37**
මුදල් හා මුදලට සමාන දෑවල ශුද්ධ වැඩිවීම/ අඩුවීම(අ) + (ආ) + (ඇ)		61,538.26	(1,186,323.63)
2011 ජනවාරි 01දිනට මුදල් සහ මුදලට සමාන දෑ		1,937,086.86	3,123,410.49
2011 දෙසැම්බර් 31දිනට මුදල් සහ මුදලට සමාන දෑ		**1,998,625.12**	**1,937,086.86**

මුදල් ප්‍රකාශනවලට අදාළ සටහන්

01. පොදු කරුණු

අ. මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුව සාදා ඇත .ගිණුම්කරණ ප්‍රතිපත්ති කලින් වර්ෂයේ භාවිත කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති සමඟ අනුකූල වන අතර ප්‍රතිපත්තිවල කර ඇති වෙනස්කම් නිසි ලෙස අනාවරණය කර ඇත.

ආ. කලින් වර්ෂය හා අදාළ සංඛ්‍යාලේඛන කලින් වර්ෂය හා සැසඳීම පහසු වන පරිදි අවශ්‍ය ස්ථානවල පෙන්වා ඇත.

ආ. මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු ප්‍රදාන ප්‍රාග්ධන සහ පුනරාවර්තන ලෙස හඳුනාගෙන ඊට අනුකූල ලෙස ගිනුම්ගත කර ඇත .ප්‍රාග්ධන ප්‍රදානය ලබා ගෙන ඇත්තේ සංවර්ධන වියදම් සහ ස්ථිර වත්කම් අත්පත් කර ගැනීම සඳහාය.

02. දේපල, පිරියත සහ උපකරණ

ස්පර්ශ්‍ය වත්කම් දක්වා ඇත්තේ පිරිවැයෙන් ක්ෂයවීම් අඩු කිරීමෙනි. පවත්නා ස්ථාවර වත්කම් සඳහා ක්ෂය වෙන්කිරීම් වත්කමේ වටිනාකම සහ ආයුකාලය සැලකිල්ලට ගනිමින් සරල මාර්ගික ක්‍රමයට සිදුකර ඇත.

මිලට ගත් වර්ෂය සඳහා සම්පූර්ණ ක්ෂය කිරීම ගණනය කරන අතර බැහැර කරන වර්ෂය සඳහා ක්ෂය වීම ගණනය කරනු නොලැබේ.

ක්ෂය කිරීමේ අනුපාතයන් පහත පරිදිය:-

කාර්යාලීය උපකරණ	12.5%
ලී බඩු	10%
පරිගණක සහ උපාංග	25%
මෝටර් වාහන	20%
පුස්තකාල පොත්	10%

03. මුදල් සහ මුදලට සමාන දෑ

මුදල් සහ මුදලට සමාන දෑවල 2011 දෙසැම්බර් 31 දිනට අතැති මුදල් සහ බැංකුවේ ශේෂය ඇතුලත් වේ.

04. වගකීම්

ශේෂ පත්‍රයේ දිනයේ සිට ඉල්ලූ විට හෝ වර්ෂයක් ඇතුළත ගෙවිය යුතු වන ගෙවීම් ජංගම වගකීම් වේ . ජංගම නොවන වගකීම් ගෙවිය යුතු වන්නේ ශේෂ පත්‍රයේ දිනයේ සිට වර්ෂයකට හෝ ඊට වැඩි කාලයකට පසුවය.

05. **පාරිතෝශික**

අවුරුදු 5ට වැඩි කාලයක් සම්පූර්ණ කළ ස්ථිර සේවකයින් නොමැති හෙයින් 2011 වර්ෂය තුළදී කිසිදු පාරිතෝශික අය කර නොමැත.

06. **ආදායම සහ වියදම**
ආදායම සහ වියදම එකතුවීමේ පදනම මත හඳුනාගනී.

08. **විවිධ ප්‍රාග්ධන ප්‍රදාන**
භාණ්ඩාගාරයෙන් ලද සම්පූර්ණ ප්‍රාග්ධන ප්‍රදානයන් " ප්‍රාග්ධන දායක ගිණුම"ට බැර කරන ලදී. වර්ෂයට අදාළවන කොටස (ක්ෂයකිරීම්වලට සමාන ප්‍රමාණය සහ සංවර්ධන වියදම් සඳහා දරනලද සම්පූර්ණ පිරිවැය) ආදායම් හා වියදම් ගිණුමට බැර කර ඇත.

09. **බදුකරණය**
ආදායම් බදු
අධිකාරිය භාණ්ඩාගාරයෙන් ප්‍රදාන ලැබූ ව්‍යවස්ථාපිත මණ්ඩලයක් වශයෙන් කිසිදු වෙන් කිරීමක් සිදුකර නොමැත.

10. **සංස්ථාපිත තොරතුරු**

සංවිධානයේ නම	:	ජාතික ව්‍යවසායකත්ව සංවර්ධන අධිකාරිය
නෛතිකභාවය	:	2006 අංක 17 දරණ ජාතික ව්‍යවසායකත්ව සංවර්ධන අධිකාරි පනත
මෙහෙයුම්වල ස්වභාවය	:	රටතුළ කුඩා සහ මධ්‍යම ව්‍යවසායකත්ව අංශයට විශේෂිත අවධානයක් සහිතව ශ්‍රී ලංකාව තුළ ව්‍යවසායකත්ව සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම, සහයදීම, ධෛර්යමත් කිරීම සහ පහසුකම් සැපයීම.

ජාතික ව්‍යවසාය සංසදය

විවිධ කොටස්කරුවන් නියෝජනය කරනු ලබන ඉහළ මට්ටමේ නිළධාරීන්ගෙන් ජාතික ව්‍යවසාය සභාව (NEF) සමන්විත වේ. ජාතික මට්ටමින් හඳුනාගත් ව්‍යාපාර ගැටළු සහ නිර්මාණයේ පහළ මට්ටමේදී මෙතෙක් නොවිසඳී ඇති ගැටළු ජාතික ව්‍යාවසාය සංසදයේදී සාකච්ඡා කෙරේ. රැස්වීම් 3ක් පවත්වන ලද අතර එහිදී සාකච්ඡා කරනු ලැබූ ගැටළු පහතින් දැක්වේ :

i. ව්‍යවසායන් සඳහා විදුලි සීමාව
ii. පාසල් සිදුන්ගේ ව්‍යවසායකත්වමය හැකියාව වර්ධනය කිරීම
iii. පශු සම්පත් ප්‍රතිපත්තිය සහ ව්‍යවසායන් සඳහා එහි භාවිතාව
iv. ව්‍යවසායන් සඳහා වඩා හොඳ සේවයක් සැපයීම සඳහා රාජ්‍ය පෞද්ගලික සංවාදය

v. අනුරාධපුර සහ පොලොන්නරුව යන දිස්ත්‍රික්කයන් තුල ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ ප්‍රමාදය
vi. අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ ව්‍යාපාරයන් සඳහා ඉඩම් ලියාපදිංචි කිරීමේ අශක්‍යතාවය
vii. SME සඳහා ණය අනුපාත ක්‍රමය

දිස්ත්‍රික් ව්‍යවසාය සංසද

ව්‍යවාසකයින්ට ව්‍යාපාර සංවර්ධන සේවා සැලසීම පිණිස දිස්ත්‍රික් ව්‍යාපාර සංසද (DEF) පිහිටුවීම ඇතුළත් වේ. DEF ස්ථාපිත කෙරෙනුයේ දිස්ත්‍රික්ක මට්ටමිනි. NEDA විසින් අනුරාධපුර, ගාල්ල, යාපනය. හම්බන්තොට, මොනරාගල, පොලොන්නරුව, මන්නාරම, මහනුවර, මාතලේ, අම්පාර, මඩකලපුව, බදුල්ල සහ කුරුණෑගල දිස්ත්‍රික්කයන් තුළ දිස්ත්‍රික් ව්‍යවසාය සංසද පිහිටුවා ඇත.

වැඩසටහනේ අරමුණු:

- දිස්ත්‍රික් මට්ටමේ ව්‍යාපාර සංවර්ධන සේවා සැපයුම්කරුවන් අතර සම්බන්ධතා ගොඩනැංවීම
- රාජ්‍ය පෞද්ගලික සංවාදයකට පහසුකම් සැලසීම
- DEF සහ SME සංගම් අතර නිසි සම්බන්ධීකරණයක් ඇති කිරීම
- DEF සංසද හරහා ව්‍යවසායකයින්හට ව්‍යාපාර සංවර්ධන සේවා සැපයීමට ක්‍රමයක් සංවර්ධනය කිරීම
- දිස්ත්‍රික් මට්ටමේ සංසදවල සිට ජාතික මට්ටමේ සංසද දක්වා ව්‍යාපාරික ගැටළු ඒකරාශී කිරීම

SME අත් පොත

NEDA විසින් SME අත්පොත- 2011-2012 සමාලෝචනය කර ප්‍රකාශයට පත් කරන ලදී. මෙය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට ආයතනයක් සොයා ගැනීම සඳහා තම වටිනා කාලය නාස්ති නොකරමින් නිවසේදීම සේවාවක් ලබා ගැනීම සඳහා ඔහු යායුතු වන්නේ කොතනටද යන්න සොයා දැන ගැනීම සඳහා අගනා තොරතුරුවලින් පිරි මූලාශ්‍රයකි.

NEDA වෙබ් අඩවි සංවර්ධනය

NEDA වෙබ් අඩවිය ධාරිතාවය, ගුණාත්මකභාවය සහ තොරතුරු සඳහා ප්‍රවේශවීමේ හැකියාව වර්ධනය කිරීම සඳහා ප්‍රතිව්‍යුහගත කරන ලදී.

ආර්ථික කලාප

ගමට ඔබින ව්‍යාපාර

"ගමට ඔබින ව්‍යාපාර " ගම් මට්ටමින් ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම සඳහාය. මහින්ද චින්තනයට අනුව රටතුළ කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකත්ව අංශය ප්‍රවර්ධනය කිරීම සඳහා විශේෂ අවධානයක් යොමු කෙරේ.

හැකියාවට රැකියාව

ඉහත වැඩ සටහන තුළින් උතුරු සහ නැගෙනහිර සුදුසු රැකියා විරහිත තරුණයන් සහ අවශ්‍ය සේවා යෝජකයන් හඳුනාගන්නා ලදී. කලාපයේ දිස්ත්‍රික්කයන් තුළ රැකියා පොලක් පැවැත්වීම මඟින් රැකියා විරහිත තරුණයන් අවශ්‍ය සේවා යෝජකයන්ට හඳුන්වා දෙනු ලැබේ.

තාක්ෂණික පුහුණු වැඩ සටහන.

NEDA විසින් ව්‍යවසායකයන්ගේ තාක්ෂණික දැණුම සහ නිපුණතාවයන් වර්ධනය කිරීම සඳහා විවිධ ප්‍රදේශයන්හි තාක්ෂණික පුහුණු වැඩසටහන් පැවැත්වීමට තීරණය කර ඇත. NEDA දේශීය තරගකාරී ලාභ වැඩසටහන් සහ ක්ෂේත්‍ර නිරීක්ෂණයන් තුළින් තාක්ෂණික පුහුණු අවශ්‍යතාවයන් හඳුනාගෙන ඇත.

ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන.

සංස්ථාපිත සැලැස්ම පරිදි, NEDA විසින් ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලයේ සහ දිස්ත්‍රික් වාණිජ මණ්ඩලවල සහයෝගයෙන් කලාපීය මට්ටමින් කුඩා සහ මධ්‍යම පරිමාණ ව්‍යවසායකයන් සඳහා ව්‍යාපාර සංවර්ධන පුහුණු වැඩසටහන් පවත්වා ඇත. මෙම වැඩසටහනේ පරමාර්ථයන් වූයේ ඔවුනගේ නිෂ්පාදන සහ සේවාවන්ගේ ගුණාත්මකභාවය සහ ඵලදායිතාවය වර්ධනය කිරීමත්, සහභාගිකයන්ගේ ව්‍යවසායකත්ව නිපුණතාවයන් වර්ධනය කිරීමත්, ඔවුන්ගේ ලාභය වැඩි කිරීමත්, කළමනාකරණ නිපුණතාවයන් වර්ධනය කිරීමත් සහ මූල්‍ය කළමනාකරණය වැඩි දියුණු කිරීමත්ය.

"දිවිනැගුම"

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය සහ සාම්ප්‍රදායික කර්මාන්ත සහ කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය විසින් "දිවිනැගුම" ජාතික වැඩසටහන යටතේ "දිවිනැගුම" කුටි කර්මාන්ත පර්ෂද ප්‍රවර්ධන ප්‍රදර්ශන සංවිධානය කර ඇත. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් මෙම ප්‍රදර්ශන සඳහා දායකවීමට ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියට ආරාධනා කර ඇත. මෙම ප්‍රදර්ශනය සියළුම දිස්ත්‍රික්කයන් (දිස්ත්‍රික් 21)තුළ සහ මෙම වර්ෂයේදී ප්‍රදර්ශන 13ක් සඳහා සැලසුම් කර ඇත.

තාක්ෂණික සංවර්ධන අරමුදල

NEDA පනතේ විධිවිධාන අනුව, ශ්‍රී ලංකාව තුළ තාක්ෂණික සංවර්ධන අරමුදලක් (TDF) ස්ථාපිත කිරීම සඳහා NEDA විසින් කැබිනට් පත්‍රිකාවක් සකස්කර එය කර්මාන්ත සහ වාණිජ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, තාක්ෂණික වුවමාරුව තුළින් පර්යේෂණ වාණිජකරණය කිරීමේ ක්‍රියාකාරී කණ්ඩායමක් ස්ථාපිත කරන ලදී. ඒ සමඟම, NEDA විසින් මැලේසියානු තාක්ෂණික සංවර්ධන සහයෝගීතාවයෙන් තාක්ෂණික සහයෝගය ලබාගැනීමේ සක්‍යතාවය ගවේශණය කරන ලදී. MTDC විසින් ශ්‍රී ලංකාව තුළ තාක්ෂණික සංවර්ධන අරමුදලක් ස්ථාපිත කිරීමේ ශක්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කරන ලද අතර එය පසුව නිර්දේශයන් සඳහා ක්‍රියාකාරී කණ්ඩායමට ඉදිරිපත් කරන ලදී.

NEDA විසින් 2011 වර්ෂය තුළ පහත සඳහන් කාර්යයන් නිම කර ඇත.

- **NCCI** සහයෝගිත්වයෙන් මොරටුව දැව පර්ෂදය සඳහා ස්වසාධන පොදු සංගමයක් වශයෙන් දැව ඉරුම් මෝල්කරුවන්ගේ සංගමය, ලී වැඩපොල හිමිකරුවන්ගේ සංගමය සහ ගෘහ භාණ්ඩ සාප්පු හිමිකරුවන්ගේ/වෙළඳුන්ගේ සංගමය යන සංගම් තුන එකතු කරමින් මොරටුව එක්සත් දැව ගෘහභාණ්ඩ සංගමය පිහිටුවීම.
- නගර සැලසුම්කරුවන්ගේ සංගමය විසින් ඉදිරිපත් කරන ලද මොරටුව හා වේවැල්දෙනිය පර්ෂදයන්ගේ විශේෂ දත්ත පදනම් සංවර්ධනය පිළිබඳ අවසන් වාර්ථාව තාක්ෂණික ඇගැයීම් කමිටුව සමග ඇගැයීම.
- පාර්ශ්වකරුවන්ගෙන් තොරතුරු විමසීමෙන් මොරටුව දැව භාණ්ඩ පර්ෂදය සංවර්ධනය කිරීම සඳහා කළමනාකරණ සමාගමක් පිහිටුවීමට කටයුතු ආරම්භ කරනු ලැබීම.
- ප්‍රකෝනි මහතා නියෝජනය කරනු ලබන ඔස්ට්‍රියාවේ වැම් **(VAM)** ආයතනයේ සහයෝගයෙන් කටුබැද්ද පිහිටි ලී වැඩ පුහුණු මධ්‍යස්ථානය ජාත්‍යන්තර මට්ටමට උසස් කිරීම සඳහා ව්‍යාපෘති යෝජනාවක් විකාශය කිරිම කෙරෙහි රැස්වීමක් ලක්සල, රාජ්‍ය දැව සංස්ථාව, ජාතික ශිල්ප සභාව (NCCC), තොරතුරු තාක්ෂණ ආයතනය (ITI) සහ කර්මාන්ත අමාත්‍යංශය සමග රැස්වීමක් පිළියෙල කිරීම.
- මොරටුව දැව භාණ්ඩ පර්ෂද ප්‍රදේශය විශේෂිත ආර්ථික කලාපයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමේ ගැසට් නිවේදනය කර්මාන්ත සහ වාණිජ අමාත්‍යංශයට කෙටුම්පත් කිරීම.
- පර්ෂද සංවර්ධනය සඳහා සංවර්ධන කොටස්කරුවන් හඳුනාගෙන ඔවුන් සමග මූලික සාකච්ඡාවන් සිදුකිරීම.
- ශ්‍රී ලංකා ජාතික ශිල්ප සභාවේ සහයෝගයෙන් මොරටුව එක්සත් දැව භාණ්ඩ සංගමය ලියාපදිංචිකිරීම සඳහාවන මූලික කටයුතු නිම කරනු ලැබීම.
- සංවර්ධන කොටස්කරුවන්ගේ සංසදය මොරටුව විශ්ව විද්‍යාලය, IDB සහ SEEDS හි පවත්වන ලදී. මෙම සංසදයේදී ගනු ලැබූ තීරණයන් මත පදනමව NEDA විසින් සකස්කරන ලද පර්ෂද සංවර්ධන වැඩසටහනේ අදාළ අංගයන් ක්‍රියාත්මක කිරීමට සංවර්ධන කොටස්කරුවන් සමග අත්සන් කළයුතු අවබෝධතා ගිවිසුම සකස් කිරීම සඳහා පියවර ගනිමින් සිටීම.
- ගෘහ භාණ්ඩ පර්ෂද සංවර්ධනයේදී සහ අවබෝධතා ගිවිසුම් සඳහා තොරතුරු හඳුනා ගැනීමේදී පවතින පොදු ප්‍රශ්න සාකච්ඡා කිරීම සඳහා ගෘහ භාණ්ඩ පර්ෂද සංවර්ධන කොටස්කරුවන් සහ මොරටුව එක්සත් දැව ගෘහ භාණ්ඩ සංගමය සමග එක් දින වැඩමුළුවක් පැවැත්වීම.
- බිංගිරිය, ගම්පහ, දන්කොටුව, මීගමුව සහ කුලියාපිටිය යන නගරවල ගෘහ භාණ්ඩ ප්‍රදර්ශන පහක් (05) පැවැත්වීම.


ආදායම සහා වියදම
45
40
35
30
25
20
15
10
5
0
2009
2010
2011
ආදායම
වියදම


පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදානයන්
මිලිය
30
25
20
15
10
5
0
2009
2010
2011
වර්ෂ
පුනරාවර්ත
ප්‍රාග්ධන

ටීසී/ඩී/එන්ඊඩීඒ/2011/එෆ්/ඒ/02 2012 දෙසැම්බර් දින

සභාපති,

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය.

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 2006 අංක 17 දරන ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය පනතේ 20 (2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අධිකාරියේ සභාපතිවරයා වෙත 2012 ඔක්තෝබර් 26 දින නිකුත් කරන ලදී.

1.2 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම හා ක්‍රියාත්මක කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 **විගණනයේ වගකීම**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්ම වල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාර වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පරිපාටීන් , වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්වය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. <u>මූල්‍ය ප්‍රකාශන</u>

2.1 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාහන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ .

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 03 ප්‍රකාර මූල්‍ය ප්‍රකාශන සමඟ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 09 ප්‍රකාර විධිමත් මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර නොතිබුණි.

2.2.2 නීති, රීති, රෙගුලාසි යන ආදියට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව	අනුකූල නොවීම
(අ) 2006 අංක 17 දරන ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාර් පනත 19(3) වගන්තිය	අදාල නියමයන්ට අනුව අධිකාරිය විසින් ජාතික ව්‍යවසාය සංවර්ධන අරමුදලක් පිහිටුවා තාක්ෂණ සංවර්ධන කාර්යයන් සඳහා වෙන් කරන ලද හෝ ලැබෙන සියළු මුදල් එම අරමුදලට බැර විය යුතු බව දක්වා තිබුණද, එම නියමයන්ට අනුකූලව කටයුතු කර නොතිබුණි.
(ආ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	
5.2.1 වගන්තිය	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අයවැය ප්‍රකාශන පිළියෙල කර විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි
6.5.1 වගන්තිය	2011 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලත විගණනය වෙත ඉදිරිපත් කළ යුතු වුවද, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත ඉදිරිපත් කර තිබුණේ 2012 ජූනි 28 දිනදීය. එනම් මාස 04 ක් ප්‍රමාදවීමෙන් පසුවය.

3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

3.1 මූල්‍ය සමාලෝචනය

3.1.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ මෙහෙයුම් කටයුතු වලින් රු.530,441 ක අතිරික්තයක් වූ අතර ඊට එරෙහිව ඉකුත් වර්ශයේ ඌනතාවය රු. 1,759,693 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.2,290,134 ක වාසිදායක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

3.1.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ සංවර්ධන වියදම් රු.10,521,203 කින් හෙවත් 120 % කින් වැඩි වුවද පුනරාවර්තන වැය සඳහා භාණ්ඩාගාරයෙන් ලැබුණු ප්‍රදාන සහ විලම්භිත ප්‍රාග්ධන ආදායම රු.21,654,073 කින් හෙවත් 113 % කින් වැඩිවීම මෙම මෙහෙයුම් ප්‍රතිඵලයේ රු. 2,290,134 ක් වූ වාසිදායක වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2008 පෙබරවාරි 04 දින එවකට සිටි සභාපතිවරයාට අනුයුක්ත කරදී තිබූ වාහනයක් ඔහු දිවයිනෙන් බැහැරව සිටින ලද අවස්ථාවකදී රියදුරු නොවන තැනැත්තෙකු විසින් ධාවනය කිරීමේදී අනතුරකට භාජනය වී තිබුණි. අනතුරෙන් සිදුවූ අලාභය අදාල පුද්ගලයා විසින් දරා ඇති හෙයින් හා එමගින් අධිකාරියට මූල්‍යමය අලාභයක් සිදු නොවූ සේ සලකා ඉතිරි ක්‍රියාමාර්ග කිසිවක් ගෙන නොතිබුණි. රාජ්‍ය ආයතනයට අයත් යම් වත්කමක් අනතුරට භාජනය වූ විට අනුගමනය කළයුතු ක්‍රියාපර්පාටිය මු. රෙ. 101 සිට 113 දක්වා ඇති හෙයින් අනතුරට අදාල වගකිවයුතු නිලධාරීන් නිශ්චය කිරීම, අලාභයේ ප්‍රමාණය නිශ්චය කිරීම, අලාභය අයකර ගන්නා ආකාරය, පොලිස් වාර්තාවේ පිටපත්

ලබාගැනීම ආදී ලෙස වූ විධිමත් ක්‍රියා මාර්ග කිසිවක් අධිකාරිය විසින් මෙම අනතුර සම්බන්ධයෙන් අනුගමනය කර නොතිබුණි.

(ආ) අධිකාරිය විසින් 2008 වර්ෂයේ සිට උපදේශකයෙකුගේ සේවය ලබාගෙන තිබුණු අතර, 2011 වර්ෂය තුලදී උපදේශක ගාස්තු ලෙස මසකට රු.60,000 බැගින් රු.720,000 ක් ගෙවා තිබුණි. නමුත් අදාල උපදේශක විසින් සපයන ලද සේවාවන්, ඔහු විසින් පිළියෙල කළ වාර්තා, සිදුකළ අධීක්ෂණයන් හෝ ප්‍රක්ෂේපන කටයුතු ආදිය පිළිබඳව අන්තර්ගත වාර්තාවක් 2011 වර්ෂයට අදාලව ලබාදී නොතබු බැවින් ගෙවන ලද මෙම උපදේශක ගාස්තු අධිකාරියට නිෂ්කාර්ය වියදමක් බැව් විගණනයේදී බැහැර කල නොහැකි විය.

(ඇ) සමාලෝචිත වර්ෂය තුලදී අධිකාරිය විසින් පෞද්ගලික සමාගමට අයත් ගොඩනැගිල්ලකින් වර්ග අඩි 4,441 ක් සඳහා රු. 4,382,072 ක් ගෙවා ලබාගෙන කාර්යාල පරිශ්‍රයේ කාමර වෙන්කරිම් ආදිය වෙනුවෙන් රු. 3,240,149 ක් අධිකාරියේ අරමුදලින් දරා තිබුණි.

5. ගිණුම්කටයුතු භාවය සහ යහපාලනය

5.1 සංයුක්ත සැලැස්ම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ක්‍රියාකාර සැලැස්ම අනුව, ක්‍රියාකාරකම් 15 ක් සඳහා රු. මිලියන 23 ක වටිනාකමක් දක්වා තිබුණද, වාර්ෂික අයවැය ඇස්තමේන්තුව තුළ වැය විෂයය අංක 2107 සඳහා පමණක් රු. මිලියන 23 ක මුදලක් වෙන් කර තිබුණි. වැය විෂයය අංක 2107, (වෙනත් වියදම්) යටතේ විෂයයන් 10 ක් සඳහා කිසිදු ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර නොතිබුණි.තවද සංයුක්ත සැලැස්මෙන් ඉදිරිපත් කළ කාලපරිච්ඡේදය සඳහා ව්‍යවසාය සංවර්ධන විෂය පථය නිශ්චිතව හදුනාගෙන නොතිබුණි.

(ආ) ක්‍රියාකාර සැලැස්ම තුල 03 වන ක්‍රියාකාරකම ලෙස දක්වා තිබුණු ඵලදායීතා වැඩිදියුණ කිරීම යටතේ වූ විෂයයන්ට අදාලව වාර්ෂික අයවැය ලෙස ඉදිරිපත් කළ වියදම් ඇස්තමේන්තුව තුල ප්‍රතිපාදන සලසා නොතිබුණු අතර, ක්‍රියාකාර සැලැස්ම තුල දක්වා තිබුණු 04 වැනි ක්‍රියාකාරකම සඳහා රු. මිලියන 0.5 ක් වර්ෂයේ (Cleaner Production) අවසාන කාර්තු දෙකට අදාලව දක්වා තිබුණ. නමුත් වාර්ෂික අයවැය ඇස්තමේන්තු තුල ඒ සඳහා ප්‍රතිපාදන නොතිබුණි. ක්‍රියාකාර සැලැසමේ 05 වැනි ක්‍රියාකාරකම සඳහා රු. මිලියන 02 ක් 2011 වර්ෂයේ මුල් කාර්තු දෙකට වෙන්කර තිබුණු අතර, වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ රු.මිලියන 11.4 ක් 2011 වර්ෂයට අදාලව දක්වා තිබුණි.

(ඇ) ක්‍රියාකාර සැලැස්මේ 06 වැනි ක්‍රියාකාරමේ 6.1 සිට 6.5 දක්වා උප විෂයයන්ට අදාලව වාර්ෂික අයවැය තුල රු.මිලියන 05 ක දක්වා තිබුණද, එක් එක් විෂයයට අදාල මුල්‍ය වටිනාකම නිෂ්චිතව සැසඳෙන අකාරයෙන් ඉදිරිපත් කර නොතිබුණ. එසේම 7 වැනි හා 8 වැනි ක්‍රියාකාරකම් සඳහා මුදල් වෙන්කිරීම් වාර්ෂික අයවැය තුළ කුමන විෂයයක මගින් සිදුකරන්නේද යන්න නිෂ්චිතව ඉදිරිපත් කර නොතිබුණි.

මේ අනුව සංයුක්ත සැලැස්ම පාදක කර ක්‍රියාකාර සැලැස්ම හා අයවැය ලේඛණය සකසා නොතිබුණු බව විගණනයේදි නිරීක්ෂණය විය.

5.2 අයවැය පාලනය

2011 වර්ෂයට අදාල තථ්‍ය ආදායම් හා වියදම් ඇස්තමේන්තුගත වටිනාකම් අතර සැලකිය යතු විචලතාවයන් දක්නට තිබුණු බැවින් වියදම් ඇස්තමේන්තුව ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගැනීමට කළමනාකාරිත්වය අපොහොසත්වී තිබුණු බැව් විගණනයේදී නිරීක්ෂණය විය.

6. පද්ධති හා පාලන

විගණනයේදි නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින් වර අධිකාරයේ සභාපතිවරයා දැනුවත් කරන ලදි. පහත දැක්වෙන පාලන කෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

(අ) ගිණුම්කරණය

(ආ) කාර්ය මණ්ඩලය

(ඇ) අයවැය පාලනය

(ඇ) වියදම් පාලනය

එච්. ඒ.එස්.සමරවීර,

විගණකාධිපති